"නැණ සිළු" - 2024

පස්වන ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

අනුමාන ප්‍රශ්න පත්‍ර අංක 01

කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - කුරුණෑගල

පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2024

I පත්‍රය

විභාග අංකය :-	කාලය :- පැය 01 යි මිනිත්තු 15 යි

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් .....


- ඔබගේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
- ප්‍රශ්නවලට පිළිතුරු තුන බැඟින් දී ඇති විට නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.
- පිළිතුරු ලිවීමට ඇත්නම් නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.


පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	


පිටු අංකය	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි.	
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි.	
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය.	


❖ **ප්‍රශ්න අංක 01, 02 දක්වා ප්‍රශ්න සඳහා මූලින් දී ඇති රූපය වෙනුවට ආදේශ කළ හැකි රූපය තෝරා යටින් ඉරක් අඳින්න.**


01. 


1) 

2) 

3) 


02. 

1) 

2) 


3) 


❖ **ප්‍රශ්න අංක 03, 04 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති රූප අතරින් අනෙක් රූප දෙක සමඟ නොගැළපෙන රූපය තෝරන්න.**


03. 1) 

2) 

3) 

04. 1) 

2) 

3) 

❖ **ප්‍රශ්න අංක 05, 06 දක්වා ප්‍රශ්න සඳහා මූලින් දී ඇති පද දෙක අතර සබඳතාවය හඳුනාගෙන හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

05. කුසගින්නට - ආහාර නම් පිපාසයට - .....

1) පැණි 2) කුරුම්බා 3) පාන

06. පෙදරේරුවා - ලඹය නම් වඩු කාර්මිකයා - .....


1) යතුකැටය 2) පෝරුව 3) සකපෝරුව

➢ **රටාව හඳුනාගෙන 07, 08 ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

07. 43268 → 52359 නම්, 12587 → .....

1) 21688 2) 23498 3) 21678

08.



1) 42 2) 36 3) 30

➢ **පහත දක්වා ඇති වාක්‍ය වැරදිය. ඒවා නිවැරදි වීමට කළ යුතු වෙනස්කම දැක්වෙන පිළිතුර තෝරන්න.**

09. අක්කා පසුපස බල්ලෝ පැන්නුවා ය.

1) ''අක්කා'' වෙනුවට ''අක්කලා'' යෙදීම.
2) ''පැන්නුවාය' වෙනුවට ''පැන්නුවෝ ය'' යෙදීම.
3) ''බල්ලෝ'' වෙනුවට ''බල්ලන්'' යෙදීම.

10. ගංගාවෝ පහළට ගලා බැස්සා ය.

1) ''ගංගාවෝ'' යන්න ''ගංගා'' ලෙස යෙදිය යුතුය.
2) ''ගලා බැස්සාය'' යන්න ''ගලා බැස්සේ ය'' ලෙස යෙදීම.
3) ''ගලා බැස්සා ය'' යන්න ''ගලා බැස්සෝ ය'' ලෙස යෙදීම.

11. මීටර 6 ක් දිග, මීටර 3 ක් පළල බිත්තියක තීන්ත ගෑමට තීන්ත ලීටර 3 ක් අවශ්‍ය වේ නම් දිග මීටර 6ක් හා පළල මීටර 5 ක් වන බිත්තියක ගෑමට කොපමණ තීන්ත අවශ්‍ය වේ ද?

1) 4 2) 5 3) 6

12. ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළින් ම සමත් වූ සිරිමල්ට උපහාර දැක්වීමේ උත්සවයක් පාසලේ සංවිධානය කර තිබිණි. එයට පැමිණි පාසලේ විදුහල්පතිතුමා, අංශභාර විදුහල්පතිතුමිය හා තවත් ගුරුවරුන් 04 ක් ඔහුට අතට අත දුන්නේ නම්, එම අවස්ථාවේ සිදු වූ අතට අත දීම් අවස්ථා ගණන කීයද?

1) 42 2) 21 3) 6

13. එක්තරා වැවක ඇති පාසි වර්ගයක් සෑම දිනකම ඊට පෙර දිනට වඩා හතර ගුණයකින් වර්ධනය වෙයි. වැව සම්පූර්ණයෙන්ම පාසි වලින් වැසී යාමට දින 08ක් ගතවූයේ නම්, වැවෙන් 1/4 ක් වැසී යාම සඳහා දින කීයක් ගත වුණි ද?

1) දින 02 2) දින 04 3) දින 07

14. පන්තියක සිටින ළමුන් 27 දෙනෙක් කැමති ආහාර පිළිබඳව විස්තරයක් පහත දැක්වේ.

- මෙම ළමුන්ගෙන් 12 දෙනෙක් ආප්ප වලට කැමති ය.
- 07 දෙනෙක් ඉදි ආප්ප වලට අකැමති ය.

ඉහත විස්තරය අනුව ආප්ප වලට පමණක් කැමති පිරිස කොපමණ ද?

1) 7 2) 5 3) 15


15. කොළ 42 ක් ඇති පොතකින් 15 වන කොළය ගැළ වී ගිය විට ඊට ප්‍රතිවිරුද්ධ පැත්තේන් ගැළ වී යන කොළයේ ඇති පිටු අංක මොනවා ද?

1) 55, 56 2) 29, 30 3) 53, 54

16. පෙරේදා දින තමන්ගේ උපන්දිනය යෙදී තිබූ බව චනුග ඊයේ ප්‍රකාශ කරන ලදී. අද 26 වැනි සිකුරාදා නම්, ඔහුගේ උපන් දිනය යෙදී තිබුණු දිනය හා දවස කවදා ද?

1) 25 - බ්‍රහස්පතින්දා 2) 24 - බදාදා 3) 23 - අඟහරුවාදා

17. මෙම මල් පාත්තිය වටා අලංකාරය සඳහා දම්වැලක් යොදා ඇත. නිවසේ හිමිකරු මෙහි හැඩය සමචතුරස්‍රාකාර කිරීමට සිතා මල් පාත්තියේ දිග වෙනස් නොකර පළල පමණක් වෙනස් කරයි. ඒ අනුව අලුතින් සෑදු පාත්තිය වටා දැමීමට තව කොපමණ දම්වැල් ප්‍රමාණයක් අවශ්‍ය වේ ද?



1) 9 m 2) 6 m 3) 12 m


18. 1, 2, 3, 4, 5 යන ඉලක්කම් අතරින් වරකට ඉලක්කම් 03ක් බැගින් යොදාගෙන ලිවිය හැකි එකිනෙකට වෙනස් සංඛ්‍යා ගණන කීයද?

1) 10 2) 20 3) 15


19. පුවත්පතක දැන්වීමක් ප්‍රකාශ කිරීම සඳහා මුල් වචන 12 ට රුපියල් 240.00 ක් අය කරයි. එතැන් සිට වැඩිවන සෑම වචනයකට ම රුපියල් 15 බැගින් අය කරයි. වචන 25 ක දැන්වීමක් ඉදිරිපත් කරන අයෙකු ඒ සඳහා කොපමණ මුදලක් ගෙවිය යුතු ද?

1) රු. 455.00 2) රු. 257.00 3) රු. 435.00


20. වර්ෂාමාන කිහිපයක් පහත දක්වා ඇත. ඒවා අතරින් නිවැරදිව අංකනය කර ඇති වර්ෂාමානය තෝරන්න.



1)




2)



3)

21. ගවයින් දෙදෙනෙකුට දින 04ක් සඳහා තණකොළ මිටි 02 ක් අවශ්‍ය වේ නම්, ගවයින් හයක් සඳහා දින 02 කට තණකොළ මිටි කීයක් අවශ්‍ය ද?

1) 3 2) 4 3) 6

22. 

මෙම ටැංකියේ ධාරිතාවය 395 *l* වේ. මෙය සම්පූර්ණයෙන් ම ජලයෙන් පුරවා ඇති අතර A නළයෙන් මිනිත්තුවකට ජලය ලීටර 8 ක් ද, B නළයෙන් මිනිත්තුවකට ජලය ලීටර 12 ක් ද, C නළයෙන් මිනිත්තුවකට ජලය ලීටර 15 ක් ද බැගින් පිටතට ගලා යයි. මෙම නළ සියල්ල එකවර විවෘත කළ විටකදී ටැංකියේ පිරී ඇති මුළු ජල පරිමාව ඉවත් වීමට කොපමණ කාලයක් ගතවේ ද?


1) මිනිත්තු 35 2) මිනිත්තු 17 3) මිනිත්තු 23

23. පොතක මිල එහි මිලෙන් 2/5 ක් හා තවත් රුපියල් 150.00 කි. පොතේ මිල කීයද?

1) රුපියල් 300.00
2) රුපියල් 250.00
3) රුපියල් 200.00

24. ප්‍රශ්න 20 කින් යුතු ප්‍රශ්න පත්‍රයකට ලැබෙන මුළු ලකුණු ප්‍රමාණය 100 කි. මෙහි එක් ප්‍රශ්නයකට වැරදි පිළිතුරක් සැපයූ විට ලකුණු 2ක් අඩු කරනු ලැබේ. ඔවින් මෙම ප්‍රශ්න පත්‍රයේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයූ අතර ඔහුට ලැබුණු ලකුණු ප්‍රමාණය 72 කි. ඔහු නිවැරදිව පිළිතුරු ලියූ ප්‍රශ්න ගණන කීයද?

1) 16 2) 15 3) 14

25. 

15 cm දිග, 12 cm පළල කාඩ්බෝඩ් කැබැල්ලකින් රූපයේ දැක්වෙන ප්‍රමාණයේ කුඩා ත්‍රිකෝණ කීයක් කපා ගත හැකි ද?

1) 20 2) 40 3) 30

➢ **x හා y නගර අතර දුර 90 km වේ. x නගරයේ සිට පෙ.ව. 8.00 ට පැයට කිලෝමීටර 10ක වේගයෙන් තිනුලි y නගරය බලා ගමන් ආරම්භ කරයි. ඊට පැයකට පසු y නගරයේ පැයකට කිලෝමීටර 6 ක වේගයෙන් ජයති x නගරය බලා පිටත්වෙයි.**

26. දෙදෙනා හමුවන විට වේලාව කීයද?

1) ප.ව. 3.00 2) ප.ව. 1.00 3) ප.ව. 2.00

27. දෙදෙනා හමුවන විට තිනුලි ගමන් කර ඇති දුර කොපමණ ද?

1) 50 km 2) 60 km 3) 45 km

➢ **දිග, පළල හා උස 4 cm වූ විශාල ඝනකයක පැති තුනක තීන්ත ආලේප කොට එම ඝනකය දිග, පළල හා උස 1 cm වන කුඩා ඝනකවලට කපා ඇත.**

28. මෙහි පැති තුනක පමණක් තීන්ත ආලේප වූ කුඩා ඝනක කීයක් තිබේ ද?


1) 08 2) 04 3) 01

29. පැති දෙකක් පමණක් තීන්ත ආලේප වූ කුඩා ඝනක කීයක් තිබේ ද?

1) 09 2) 12 3) 06

30. එක් කණ්ඩායමක ගැහැනු 3 ක් හා පිරිමි 5ක් බැගින් වන කුඩා කණ්ඩායම් 15 ක් ඇත. මෙම කණ්ඩායම්වල සිටින පිරිසම යෙදා ගනිමින් එක් කණ්ඩායමකට ගැහැනු 5 ක් හා පිරිමි 3 ක් බැගින් වන කුඩා කණ්ඩායම් කීයක් සාදාගත හැකි ද?

1) 15 2) 09 3) 08

31. 

1, 2, 3, 4, 5, 6 යන ඉලක්කම් දී ඇති රූපය තුළ ස්ථානගත කළ යුත්තේ එක ළඟ පිහිටි ඉලක්කම් දෙකක වෙනස 1ක් නොවන පරිද්දෙනි. එලෙස ඉලක්කම් යොදා රූපය සම්පූර්ණ කළ හැකි ආකාර කීයක් තිබේ ද?

1) 1 2) 2 3) 3

32. උත්සවයක් සඳහා 1 - 180 දක්වා අනුපිළිවෙළින් අංක යෙදූ පුටු ක්‍රමානුකූලව අසුරා ඇත. මෙම පුටු අතර 1 හා 5 යන ඉලක්කම් එක ළඟ යෙදුණ පුටු කීයක් තිබේ ද?

1) 13 2) 14 3) 15

33. විනිවිද නොපෙනෙන පෙට්ටියක රතු, කහ, නිල් හා රෝස යන වර්ණවලින් යුතු ටික් බෝල 5 බැගින් ඇත. පෙට්ටිය දෙස නොබලා වරකට එක බැගින් බෝල ඉවතට ගන්නේ නම් එකම වර්ණයෙන් යුතු ටික් බෝල 3ක් ලැබීමට කී වාරයක් මල්ලට අත දැමිය යුතු ද?

1) 5 2) 8 3) 9

34. වෘත්තාකාර හැඩතලයක සමදුරින් පිළිවෙළින් 0 - 9 තෙක් ඉලක්කම් සටහන් කර ඇත. එහි ඉරට්ටේ සංඛ්‍යා යා වන ලෙස එක් ලණුවක් ද ඔත්තේ සංඛ්‍යා යා වන ලෙස එක් ලණුවක් ද වශයෙන් ලණු දෙකක් සෘජු මාවතක් ඔස්සේ ඇඳ ඇත. එලෙස ලණු යා කළ පසු මතුවන රූපයේ ත්‍රිකෝණ හැඩ කීයක් දැකගත හැකි ද?

1) 10 2) 15 3) 25

➢ **කමල්, විමල් හා සුමල් යනු මිතුරන් තිදෙනෙකි. මොවුන් මාතර, කුරුණෑගල හා ගම්පහ පදිංචිකරුවන් වේ. ගුරු, වෛද්‍ය හා කාර්මික රැකියාවල මේ අය නිරතවන අතර අලිපේර, අන්නාසි හා අඹ ප්‍රියතම පලතුරු වේ. මෙම තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ පිළිවෙළින්ම නොවන අතර පහත විස්තරය බලා පිළිතුරු ලියන්න.**

- කමල් වෛද්‍යවරයා නොවන අතර ඔහු කුරුණෑගල පදිංචිකරුවෙකි.
- අලිපේර වලට කැමති මාතර පදිංචිකරුවා වන අතර ඔහු විමල් නොවේ.
- විමල් වෛද්‍යවරයා වන අතර කාර්මික ශිල්පියා අලිපේරවලට ප්‍රිය කරයි.
- ගුරුවරයාගේ ප්‍රියතම පළතුර අඹ වේ.

35. අන්නාසි වලට ප්‍රිය කරන්නේ කවුද?

1) කමල් 2) විමල් 3) සුමල්

36. අඹවලට ප්‍රියකරන්නා පදිංචි දිස්ත්‍රික්කය කුමක් ද?

1) කුරුණෑගල 2) ගම්පහ 3) මාතර

37. පහත විස්තරය කියවා පිළිතුර තෝරන්න.

මුල් අකුර කසයේ ඇත. බසයේ නැත.
දෙවන අකුර සවනේ ඇත. පවනේ නැත.
තෙවන අකුර යවුලේ ඇත. පවුලේ නැත.

1) කවය 2) කසළ 3) කසය

38. නූල් කැබැල්ලක් පොටවල් 05 ක් ලැබෙන සේ නවා ස්ථාන 3 කින් කැපූ විට නූල් කැබලි කීයක් ලැබේ ද?

1) 15 2) 16 3) 9

39. 2020 වර්ෂයේ 150 වන දිනයට අදාළ මාසය හා දිනය කුමක් ද?

1) මැයි 27 2) මැයි 28 3) මැයි 29

40. පැය බාගයකට බෙහෙත් පෙති $\frac{1}{2}$ බැගින් බොන අයෙකුට පෙති 06ක් බීම සඳහා ගතවන කාලය කොපමණ ද?

1) පැය 5 මිනිත්තු 30
2) පැය 6.00
3) පැය 6 මිනිත්තු 30

"නැණ සිල්" - 2024

පස්වන ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

අනුමාන ප්‍රශ්න පත්‍ර අංක 01

කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - කුරුණෑගල

පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2024

II පත්‍රය

විභාග අංකය :-	කාලය :- පැය 01 යි මිනිත්තු 15 යි

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් .....

- ඔබගේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
- ප්‍රශ්නවලට පිළිතුරු තුන බැගින් දී ඇති විට නිවැරදි පිළිතුර තෝරා ගෙන ඊට යටින් ඉරක් අඳින්න.
- පිළිතුරු ලිවීමට ඇත්නම් නිවැරදි පිළිතුරක් තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

පිටු අංකය	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි.	
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි.	
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය.	

01. හිරු රැසින් කැකෑරෙන දිය පිසගෙන එන සුළඟ අපගේ කයත් සිතත් පිනවයි. සමහර ඔරුකාරයෝ තමන්ගේ ඔරු එගොඩ බලා යාත්‍රා කරවති. ඇතැම් ඔරුකාරයෝ ගඟ පළින් පළ නවත්වන ලද ඔරුවල හිඳගෙන තවම මාළු බාති. දකුණු අත නමා එහි තබා විදහාගත් දැල ඇතිව සිටි මිනිසෙකු සහිත ඔරුව තවත් එකෙක් අපේ දූපත බලා පදවයි. නිසන්සල මහා මූකළානද කඳුගැට ද අතුරන ලද මහා ඉඳුනිල් මිණි පෝරුවක් වැනි නිසන්සල දිය කඳ ද ඉමක් කොනක් නැති අහසට හිමි ගොළු බව තියුණු කරයි. මගේ සිත දොම්නසින් පෙළෙන්නට වූයේ මේ ගොළු බව නිසා යයි හැඟේ.

ඡේදය ඇසුරෙන් පමණක් පිළිතුරු සපයන්න.

1) කයත් සිතත් පිනවූයේ කුමක් පිසගෙන එන සුළඟ ද? .....

2) මෙහි සඳහන් යුගල පදය තෝරා ලියන්න. .....

3) ඡේදයේ සඳහන් ප්‍රාණවාචී ඒකවචන අනුක්ත නාමපදය කුමක් ද? .....

4) ''දුකින්'' යන අදහස දීමට ඡේදයේ යොදා ඇති පදය කුමක් ද? .....

5) මේ ඡේදයේ ඇති උපමාව තෝරා ලියන්න. .....

6) කෙටි වක් පාපිල්ල සහ කෙටි කොන් පාපිල්ල පිළිවෙලින් යෙදී ඇති වචනයක් ලියන්න. .....

02. අතීත කාල බහුවචන ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

1) ගැයුවාය 2) කළෝය 3) දුවති

03. ප්‍රාණවාචී බහුවචන උක්ත නාමපදය කොටුවෙන් තෝරා ලියන්න.

දරුවන්	ඔවුහු	අප	ගොවීන්

.....

04. හිස්තැනට ගැළපෙන වචනය තෝරා හිස්තැනෙහි ලියන්න.

1) සමහරු ගීත ගායනා ..... (කරති / කරයි)

2) ඈ සීනිබෝලය මා හා බෙදා ..... (ගත්තා ය / ගත්තේ ය)

3) මල් ඇතට පාවී ..... (ගියේ ය / ගියහ)

4) උෆ කෑම වලින් බඩ පුරවා ..... (ගත්තේ ය / ගත්තෝ ය)

05. ගැළපෙන විරාම ලකුණ යොදා නැවත ලියන්න.

අද අපි මොනවද කරන්නේ චමත්ක ඇසුවා

.....

06. පහත සඳහන් අදහස් වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉර මත ලියන්න.

සුදුසු නුසුදුසු දේ විචාර බුද්ධියෙන් නොවිමසා කතා කිරීම.

.....

07. එක් එක් වගන්තියට ගැළපෙන ඉඟිවැකිය වරහන් තුළින් තෝරා දී ඇති හිස්තැනෙහි ලියන්න.

(අකුරක් නෑර, මුරුංගා අත්තේ තියනවා, එක හුස්මට, අහසේ මාලිගා)

1) යම්කිසි කාර්යයක් අවසන් වන තුරු නොනවත්වා කිරීම.

.....

2) රවටනු පිණිස වර්ණනා කිරීම.

.....

08. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

1) අදිෂ්ඨානය / අධිෂ්ඨානය / අධිශ්ටානය

09. ස්ත්‍රී ලිංග ඒක වචන අතීතකාල වාක්‍යකට හරවා ලියන්න.

වෛද්‍යවරයා රෝගීන්ට ප්‍රතිකාර කරයි.


.....


10. පහත එක් එක් වගන්තිවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

1) සතුන් වැවට බැස දිය බොති ( )

2) නංගී පාඩම කියවීම ආරම්භ කළේය ( )

11. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන්ම ලියන්න.



..... 

.....

➢ **පහත දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් බැඟින් ලියන්න.**

1) am / ten / old / years / I

.....

2) eating / I / fresh / am / fruits

.....

12. එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

1) clouds - ..... 2) Airport - .....

13. 1) ''කළුවුංගළ්'' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

.....


2) ''අයියලා'' යන වචනය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

.....

3) පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.


ඔයාට වතුර ඕනෙද? .....

4) කාහම් එන්න නිරම් මෙහි සිංහල අදහස ලියන්න. .....

14. 

රවුම තුළ ඇති සියලුම ඉලක්කම් යොදාගෙන 5 ඉලක්කමෙන් නිරූපිත අග ය 500 ද 6 ඉලක්කමෙන් නිරූපිත අය 60 ද වන ඉලක්කම් හතරේ සංඛ්‍යා 2 ක් ලියන්න.

....

15. 

ගණක රාමුවේ නිරූපණය වන සංඛ්‍යාවට 40 ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

.....

16. පහත සංඛ්‍යා රටා වල හිස්තැන් සම්පූර්ණ කරන්න.

1) 132, 123, 114, 105 .....

2) 74, 69, 64, 59, ...

17. පස්වරු 6 පසුවී මිනිත්තු 30 සම්මත වේලාවෙන් ලියන්න.


18. 40207 සංඛ්‍යාව අකුරෙන් ලියන්න. .....

19. 6534, 5436, 5643, 5364, 6345 මෙම සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට ලියූ විට මැදට ආ යුතු සංඛ්‍යාව ලියන්න. .....

20. විසඳන්න.

kg	g
8	60
+ 3	50

l	ml
10	75
+ 6	45



21. 

1) අඳුරු කර ඇති ප්‍රමාණය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.
.....

2) අඳුරු නොකළ කොටස භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න.
.....

22. 450ml අල්ලන වීදුරුවකින් හතරවාරයක් දැමූ විට විශාල භාජනයෙන් $\frac{1}{4}$ ක් පිරවිය හැකිය. එසේ නම් විශාල භාජනයට දැමිය හැකි මුළු ජල ප්‍රමාණය කොපමණ ද?
.....

23. අඹගෙඩි 72 කින් හතරෙන් පංගු තුනක තිබෙන අඹගෙඩි ගණන කීයද?
.....

24.  

1) ඉහත ඝනවස්තු දෙකේම තිබෙන ශීර්ෂ ගණනේ එකතුව කීයද? .....

2) මේ ඝනවස්තු දෙකෙහි තිබෙන මුහුණත් අතර වෙනස කියද? .....

25. ප්‍රාථමික අංශයේ ක්‍රීඩා උළෙල පැය 4 මිනිත්තු 50 ක් පවත්වා පෙ.ව. 11.45 ට අවසන් කළේ නම් එම ක්‍රීඩා උළෙල ආරම්භ කළ වේලාව ලියන්න. .....

➢ **පහත බිල්පත සම්පූර්ණ කරන්න.**

	ද්‍රව්‍ය	මිලට ගත් ප්‍රමාණය	1kg ක මිල	වටිනාකම	
				රු.	සත.
26.	පිටි	750	96.00	.....	.....
27.	සීනි	250	84.00	.....	.....
28.	පරිප්පු	500	98.00	.....	.....
29.			මුළු මුදල	.....	.....

➢ **අංක 30 සිට 60 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

30. 'හේනේ පැලේ මා විඳිනා සුරැක්කන්' යන පද පේළිය අයත් ජනකවි වර්ගය වන්නේ,
1) පැල්කවි 2) කුරක්කන් කවි 3) ගොයම් කවි

31. පුංචි පුංචි වගකීම් දැරීමට මගේ හිතේ ඇතිවූ උනන්දුව මගේ යාළුවන්ටත් දැනේවා!
1) හතරවන පියවරයි 2) හතරවන පියවරයි 3) පස්වන පියවරයි

32. සමනල ජීවන චක්‍රයේ පළමු අවස්ථාව වන බිත්තර දැකගත හැකි ශාක පත්‍රය වන්නේ
1) දෙහි 2) කතුරුමුරුංගා 3) අරලිය

33. රාජ්‍ය ලාංඡනයේ ඇති පුන්කලසින් නිරූපණය වන්නේ
1) සදාතන පැවැත්ම 2) සෞභාග්‍ය හා පරිපූර්ණ බව
3) ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය

34. එළබටු මලේ සහ වට්ටක්කා මලේ වර්ණ පිළිවෙළින්
1) දම් සුදු 2) කහ දම් 3) දම් කහ

35. අප රටේ ප්‍රධානතම මාර්ගයක් වන A_9 මාර්ගය විහිදෙන්නේ කුමන නගර දෙක අතරද?
1) කොළඹ - මහනුවර 2) මහනුවර - යාපනය 3) කොළඹ - ගාල්ල

36. සිතියම්වල අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග හා මහා මාර්ග පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
1) රතු කළු දම් 2) දම් කළු රතු 3) දම් රතු කළු

37. දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ හඳුනාගැනීමේ පහසුව සඳහා රුපියල් 1000 නෝට්ටුවේ වම්පස ඉහළ කෙළවරේ යොදා ඇති තිත් ගණන
1) 4 2) 5 3) 6

38. මුහුදුබඩ දුම්රිය මාර්ගයේ ගමන් මාර්ගය වන්නේ
1) කොළඹ සිට ත්‍රිකුණාමලය තෙක්
2) කොළඹ සිට මාතර තෙක්
3) කොළඹ සිට මඩකලපුව තෙක්

39. දැල්පන්දු පාපන්දු හා රගර් ක්‍රීඩාවල එක් කණ්ඩායමක සිටින ක්‍රීඩකයින් ගණන පිළිවෙලින්
1) 7 11 15 2) 6 11 15 3) 11 15 7

40. රිටිගල කන්ද පිහිටා ඇති දිස්ත්‍රික්කය වන්නේ
1) අනුරාධපුරය 2) පොළොන්නරුව 3) මාතර

41. චුම්භකයක දක්ෂිණධ්‍රැවය දක්වා ඇති වර්ණය වන්නේ

1) නිල් 2) රතු 3) කළු

42. නැගෙනහිර පළාතට අයත් පළාත් පුෂ්පය වන්නේ

1) ගොඩමානෙල් 2) බිනර 3) හීන්බෝවිටියා

43. වට රවුමකදී අනිවාර්යයෙන්ම ප්‍රමුඛතාවය දිය යුත්තේ කවර දෙසින් එන වාහන සඳහාද?

1) ඉදිරියෙන් 2) දකුණෙන් 3) පිටුපසින්

44. කරක්ගෙඩිය, වරක්කලය, ලෙවලය භාවිත කරන පුද්ගලයින් පිළිවෙළින්

1) වඩුවා ධීවරයා සන්නාලියා
2) ධීවරයා පෙදරේරුවා වඩුවා
3) ධීවරයා වඩුවා පෙදරේරුවා

45. දුටත් යනෙන විටත් දුවන පිටත් පොට ගසා පනිමින මෙම පද පේළිය අයත් වන්නම වන්නේ

1) මුසලඩි වන්නම 2) හනුමා වන්නම 3) තුරගා වන්නම

46. මදටිය නාගදරණ හා අගුණ බීජ ව්‍යාප්ත වන ක්‍රම පිළිවෙලින්

1) සතුන්, පිපිරීම,ජලය 2) පිපිරීම,ජලය,සතුන් 3) පිපිරීම,සතුන්,සුළඟ

47. පිටගැස්ම රෝගය සෑදීම වළක්වා ගැනීමට අත්බෙහෙතක් ලෙස තම්බා පානය කිරීමට දෙන්නේ

1) බෙලිමල් 2) වෙනිවැල්ගැට 3) දෙළුම්

48. කණමැදිරියා ආහාරයට ගැනීමට ප්‍රියකරන ශාක පත්‍රය වන්නේ

1) පාවට්ටා 2) කැන්ද 3) කෙසෙල්

49. මේ අතරින් සිනිඳු මතුපිටක් සහිත බීජයක් වන්නේ

1) නෙල්ලි 2) වෙරළු 3) සියඹලා

50. හෙල්මලු ක්‍රමයට වී වගා කර ඇති ප්‍රදේශයක් වන්නේ

1) මාතර 2) පුත්තලම 3) නුවර එළිය

51. බොත්තම් කාසයක් මසා ගැනීම සඳහා යොදාගන්නා මැහුම් ක්‍රමය වන්නේ

1) බ්ලැන්කට් මැස්ම 2) දම්වැල් මැස්ම 3) කතිරමැස්ම

52. කසළ වර්ගීකරණය යටතේ ප්ලාස්ටික් ... බැහැර කළ යුතු භාජනයේ වර්ණය වන්නේ

1) තැඹිලි 2) රතු 3) කොළ

53. සකපෝරුව යොදාගනු ලබන්නේ

1) රෙදිවීවීමට 2) තෙල් සිඳීමට 3) වළං සෑදීමට

54. මුඛය ආශ්‍රිත රෝග හා අස්ථි ආශ්‍රිත රෝග ඇතිවීමට බලපාන පෝෂ්‍ය පදාර්ථය පිළිවෙළින්

1) විටමින් B සහ විටමින් C 2) විටමින් A සහ විටමින් C

3) විටමින් C සහ විටමින් D

55. කාන්දම් දෙකක් ආකර්ෂණය වන ආකාරය නිවැරදිව දැක්වෙන රූපය වන්නේ

1) 

2) 

3) 

56. අධික පැණිරසින් යුක්ත ආහාර පාන ගැනීම නිසා සෑදෙන රෝගයක් වන්නේ

1) දිය වැඩියාව 2) අධිරුධිර පීඩනය 3) අම්ල පිත්ත රෝගය

57. නිවැරදි ඇවිදීමකදී පාදය තැබිය යුතු පිළිවෙළ වන්නේ

1) ඇඟිලි පතුල විළුඹ
2) විළුඹ පතුල ඇඟිලි
3) පතුල ඇඟිලි විළුඹ

58. සූර්යග්‍රහණය සිදුවීම පිළිබඳ ඉතා නිවැරදි ප්‍රකාශය වන්නේ

1) සූර්යයා හා පෘථිවිය අතරට චන්ද්‍රයා පැමිණීම
2) පෘථිවිය හා චන්ද්‍රයා අතරට සූර්යයා පැමිණීම
3) සූර්යයා හා චන්ද්‍රයා අතරට පෘථිවිය පැමිණීම

59. බැරලයක් ලොරියකට පහසුවෙන් පැටවීමට යොදාගන්නේ.

1. දැතිරෝදය 2. ආනතතලය 3. කප්පිය

60. පාසල නිමවී ඔබ නංගි සමඟ නිවස වෙත එන අතරමග පාර අයිනේ ළිඳකට වැටී කෑගසන පුස් පැටියෙකු දකියි. ඉන් පසුව ඔබ සිදුකරන දේ නිර්මාණාත්මක වාක්‍ය තුනකින් ලියන්න. (සෑම වාක්‍යයකම වචන පහකට නොඅඩු විය යුතුය. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.)

1) .....
.....

2) .....
.....

3) .....
.....